# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2007 අංක 25 දරන ලංකා හෝටල් සංස්ථා (ඉවත් කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 2007 ජූලි මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2007 ජූලි මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පල කරන ලදී.

ශ්‍රී ලංකා ජනරජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිල : රු. 4.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි

## 2007 අංක 25 දරන ලංකා හෝටල් සංස්ථා (ඉවත් කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2007 ජූලි මස 12 වන දින]

එල්.ඩී. — ඕ. 41/2005.

**ලංකා හෝටල් සංස්ථාවේ කර්තව්‍ය, එම කර්තව්‍ය භාර ගැනීම සඳහා ම සංස්ථාගත කරනු ලැබූ පොදු සමාගමක් විසින් භාර ගැනීම සඳහා ද ; 1966 අංක 14 දරන ලංකා හෝටල් සංස්ථා පනත ඉවත් කිරීම සඳහා ද ; ඊට සම්බන්ධ සහ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. (1) මේ පනත 2007 අංක 25 දරන ලංකා හෝටල් සංස්ථා (ඉවත් කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. 1966 අංක 14 දරන ලංකා හෝටල් සංස්ථා පනත ඉවත් කිරීම (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක සිට බලාත්මක විය යුතු ය. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මකවීමේ දිනය.

(2) ලංකා හෝටල් සංස්ථා පනත ඉවත් කිරීම නොතකා, අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ විධානයක් කරමින් විධානයේ නිශ්චිතව දක්වනු ලබන පරිදි ලංකා හෝටල් සංස්ථාවේ කර්තව්‍ය අත්පත් කර ගැනීම සඳහා සමාගමක් සංස්ථාගත කරන ලෙස සමාගම් රෙජිස්ට්‍රාර්වරයාට විධාන කරනු ලැබිය යුතු ය. එම විධානය ප්‍රකාරව සංස්ථාගත කරනු ලබන සමාගම "සීමාසහිත ලංකා හෝටල් සංස්ථාව" යනුවෙන් නම් කරනු ලැබිය යුතු ය. 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධිවිධාන සීමාසහිත ලංකා හෝටල් සංස්ථාවට සහ එම සංස්ථාව සම්බන්ධයෙන් අදාළ විය යුතු ය :

එසේ වුව ද, 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ 2 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ලංකා හෝටල් සංස්ථාව විසින් දරන ලද සාමාන්‍ය සහ වරණීය කොටස්, සතු කිරීමට අදාළ නොවිය යුතු අතර, ඒ අනුව එම දිනයේ දී අදාළව තිබූ සාමාන්‍ය සහ වරණීය කොටස් ව්‍යුහය නියමිත දිනයේ සිට බලපවත්වන පරිදි සීමාසහිත ලංකා හෝටල් සංස්ථාවේ කොටස් ව්‍යුහය ලෙස අඛණ්ඩව අදාළ කරගනු ලැබිය යුතු ය :

2—P L 002162- 3,600 (2007/06)

එසේ ම තවදුරටත්,—

(අ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ලංකා හෝටල් සංස්ථාවේ කොටස් හිමියන් නියමිත දිනයේ සිට බලපවත්වන පරිදි සීමාසහිත ලංකා හෝටල් සංස්ථාවේ කොටස් හිමියන් ලෙස අඛණ්ඩව පැවතිය යුතු ය ; සහ

(ආ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධූර දරන ලංකා හෝටල් සංස්ථාවේ අධ්‍යක්ෂවරු නියමිත දිනයේ සිට බලපවත්වන පරිදි සීමාසහිත ලංකා හෝටල් සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂවරු ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) යම් ලිඛිත නීතියක, දැන්වීමක, නිවේදනයක හෝ වෙනත් ලේඛනයක "ලංකා හෝටල් සංස්ථාව", "ලංකා හෝටල් සංස්ථාවේ කොටස් හිමියන් " සහ "ලංකා හෝටල් සංස්ථාවේ අධ්‍යක්ෂවරු" යනුවෙන් වූ සෑම සඳහන් කිරීමක් ම පිළිවෙලින් "සීමාසහිත ලංකා හෝටල් සංස්ථාව", "සීමාසහිත ලංකා හෝටල් සංස්ථාවේ කොටස් හිමියන් " සහ "සීමාසහිත ලංකා හෝටල් සංස්ථාවේ අධ්‍යක්ෂවරු" සඳහා කරන ලද සඳහන් කිරීමක් ලෙස කියවා තේරුම් ගත යුතු ය.

(4) (අ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධූර දරන ලංකා හෝටල් සංස්ථාවේ නිලධරයන්ට සහ සේවකයන්ට නියමිත දින සිට බලපවත්වන පරිදි ඔවුන් විසින් නියමිත දිනයට පෙරාතුව වූ දිනයේ දී භුක්ති විඳිනු ලැබූ නියම සහ කොන්දේසිවලට වඩා අඩුවෙන් වාසිදායක නොවන නියම සහ කොන්දේසි මත සීමාසහිත ලංකා හෝටල් සංස්ථාවේ සේවා නියුක්තිය පිරිනැමිය යුතු ය.

(ආ) ලංකා හෝටල් සංස්ථාවේ සේවා නියුක්තයකු විසින් සීමාසහිත ලංකා හෝටල් සංස්ථාවේ සේවා නියුක්තිය භාර ගැනීම 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ කාර්ය සඳහා ලංකා හෝටල් සංස්ථාව විසින් එම සේවා නියුක්තයාගේ රක්ෂාව අවසන් කිරීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(ඇ) සීමාසහිත ලංකා හෝටල් සංස්ථාවේ සේවයෙන් ඉවත් වීමට තෝරා ගන්නා, (අ) ඡේදයේ සඳහන් යම් නිලධරයකු හෝ සේවකයකු විසින් සීමාසහිත ලංකා හෝටල් සංස්ථාවේ සේවය ඔහුට පිරිනැමීමේ හැකියාව පිළිබඳ ඔහුට දැනුම් දුන් දිනයේ සිට මාස තුනක කාලයක් ඇතුළත එම තෝරා ගැනීම කළ හැකි ය. නිලධරයකු හෝ සේවකයකු පිරිනමන ලද සේවය භාර නොගැනීමට ස්වකීය තෝරා ගැනීම ක්‍රියාත්මක කරයි නම්, අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව, තත් කාර්ය සඳහා ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමයක් යටතේ ඔහුට වන්දි මුදල් ගෙවනු ලැබිය යුතු ය.

(ඈ) සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයකු වන්නා වූ ද (ඇ) ඡේදයේ සඳහන් ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාම ගන්නා වූ ද, යම් නිලධරයකු හෝ සේවකයකු, එම ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමය යටතේ වන්දි ලබාගෙන විශ්‍රාම ගැනීමෙන් පසුව, සේවක අර්ථසාධක අරමුදලේ එම නිලධරයාගේ හෝ සේවකයාගේ පෞද්ගලික ගිණුමේ බැරට ඇති සම්පූර්ණ මුදල, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඊ) ඡේදයේ (ii) වන අනු-ඡේදයේ විධිවිධාන ප්‍රකාරව, ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් එම නිලධරයාට හෝ සේවකයාට ගෙවනු ලැබිය යුතු ය.

(5) භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමතය ඇතිව, ලංකා හෝටල් සංස්ථාවේ ඉතිරි වරණීය කොටස් සාමාන්‍ය කොටස් බවට පරිවර්තනය කොට එම කොටස් හෝ එම කොටස්වල යම් අයිතිවාසිකම් බැහැර කරනු ලැබිය හැකි නමුත්, එම කොටස්වලින් සියයට දහයක ප්‍රතිශතයක් නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ලංකා හෝටල් සංස්ථාවේ සේවයේ නියුක්තව සිටි සේවා නියුක්තයන් අතර අමාත්‍යවරයා විසින් විධානය කරනු ලබන ආකාරයට බෙදා දෙනු ලැබිය යුතු ය. තව ද, එම කොටස් එම සේවා නියුක්තයන්ගේ නමින් සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සතු කරනු ලැබිය යුතු ය.

(6) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද සීමාසහිත ලංකා හෝටල් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ භාරකාර මණ්ඩලයෙන් සාමාජිකයකු ඇතුළත් විය යුතු බවට සීමාසහිත ලංකා හෝටල් සංස්ථාවේ සාංගමික සංස්ථා පත්‍රයෙහි සහ ව්‍යවස්ථාවලියෙහි විධිවිධාන අන්තර්ගත විය යුතු ය.

**2**. (1) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පවතින ලංකා හෝටල් සංස්ථාවේ සියලු කොන්ත්‍රාත්, ගිවිසුම් සහ වෙනත් සාධන පත්‍ර නියමිත දිනයේ සිට බලපවත්වන පරිදි සීමාසහිත ලංකා හෝටල් සංස්ථාව විසින් ගිවිස ගන්නා ලද කොන්ත්‍රාත්, ගිවිසුම් සහ වෙනත් සාධන පත්‍ර ලෙස සලකනු ලැබිය යුතු ය. ව්‍යාවර්තන.

(2) ලංකා හෝටල් සංස්ථාව විසින් හෝ එයට එරෙහිව පවරනු ලැබ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී අවසන් නොවී පවත්නා නඩු, නඩුකර සහ වෙනත් නීති කෘත්‍ය නියමිත දිනයේ සිට බලපවත්වන පරිදි

අවස්ථාවෝචිත පරිදි සීමාසහිත ලංකා හෝටල් සංස්ථාව විසින් හෝ ඊට එරෙහිව පවරන ලද නඩු, නඩුකර සහ වෙනත් නීති කෘත්‍ය ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පවත්නා ලංකා හෝටල් සංස්ථාවේ සියළු අයිතිවාසිකම්, බැරකම් සහ වගකීම් නියමිත දිනයේ සිට බලපවත්වන පරිදි සීමාසහිත ලංකා හෝටල් සංස්ථාවේ අයිතිවාසිකම්, බැරකම් සහ වගකීම් ලෙස සළකනු ලැබිය යුතු ය.

(4) යම් නඩුවක දී හෝ නීති කෘත්‍යයක දී යම් අධිකරණයක් විසින් ලංකා හෝටල් සංස්ථාවේ වාසියට හෝ ඊට එරෙහිව සටහන් කරනු ලැබ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඉටු නොකර පවතින සෑම තීන්දු ප්‍රකාශයක් ම, ආඥාවක් ම හෝ නඩු තීන්දුවක් ම නියමිත දිනයේ සිට බලපවත්වන පරිදි සීමාසහිත ලංකා හෝටල් සංස්ථාවේ අවස්ථාවෝචිත පරිදි වාසියට හෝ ඊට එරෙහිව සටහන් කරන ලද තීන්දු ප්‍රකාශයක්, ආඥාවක් හෝ නඩු තීන්දුවක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

4. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ—

"ලංකා හෝටල් සංස්ථාව" යන්නෙන්, 1966 අංක 14 දරන ලංකා හෝටල් සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ලංකා හෝටල් සංස්ථාව අදහස් වේ ;

"සේවක අර්ථසාධක අරමුදල" යන්නෙන්, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ පිහිටුවනු ලැබූ සේවක අර්ථසාධක අරමුදල අදහස් වේ ;

"සේවා නියුක්තයන්ගේ භාර අරමුදල" යන්නෙන්, 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත යටතේ පිහිටුවන ලද සේවා නියුක්තයන්ගේ භාර අරමුදල අදහස් වේ ; සහ

"පොදු සමාගම" යන්නෙන්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ පොදු සමාගමක් අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.